



නිසිනි දිසෙල්යා අඹවත්ත

# නුවණක්කාර මුව පැටියා


## නිසිනි දිසෙල්‍යා අඹවත්ත


## කතෘගේ වෙනත් කෘති

මම දිනනවමයි


මහාමායා බාලිකා විද්‍යාලය

**6** ශ්‍රේණිය A


2026.05.20


ISBN 978-624-208-970-6

# පිදුම

සුරතල් සතුන් ඇති කරන මගේ ආදරණීය
යහළුවන් හැමෝටම ආදරයෙන්
පිළිගන්වමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# නුවණක්කාර මුව පැටියා

එකමත් එක පුංචි රටක ලස්සන පුංචි කැලෑවක් තිබුණා. ඒ කැලෑව ඇතුලේ පොඩි සතුන්, ලොකු සතුන්,සර්පයෝ, කුරුල්ලෝ වගේ ගොඩක් කට්ටිය ජීවත් වුනා.



හැමදාම මේ කැලෑවෙ ඉන්න සතුන් වතුර බොන්න සහ කෑම කන්න කැලෑවෙ තිබුන ගඟ ලගට එකතු වෙනවා. හැමෝම ඒ වෙලාවට ආගිය තොරතුරු කතා වෙනවා. එකිනෙකාට උදව් කර ගන්නවා. ඇත්තටම බලන්න හරිම ලස්සනයි.

හරියට පුංචි ගම්මානයක් වගෙයි

ඉතින් යාළුවනේ, මේ කැලෑවෙ බොහොම හොද අහිංසක සත්තු වගේම  බොහොම නපුරු කපටි සත්තුත් ජීවත් වුනා.

ඒ වගේම මේ කැලෑවේ ගංගා, ඇල, දොල, වැව් පොකුණු වගේ දේවල් ගොඩක් තිබුණා. හරිම ලස්සනයි

ඉතින් යාළුවනේ, මේ කැලෑවේ මුවන් හාවුන් ලේනුන් වගේ බොහොම අහිංසක සත්තු වගේම කොටි රාළ, සිංහ රාළ වගේ බොහොම නපුරු සත්තුත් හිටියා. ඒ වගේම නරි රාළ වගේ කපටි අයත් හිටියා.
මේ අතරින් ගොඩක් නපුරු කෙනෙක් තමයි මේ කැලෑවේ ජීවත් වුන කොටි රාළ.
එයා හැම වෙලාවෙම උත්සාහ කලේ කැලෑවේ ජීවත් වුන පොඩි පොඩි සත්තු දඩයම් කරලා එයාගෙ කුසගින්න නිවා ගන්න.



එක දවසක් මේ කොටි රාළ උදේම ගියා කෑම සොයාගෙන. ඒ වෙලාවෙ දැක්කා පුංචි මුව පැටියෙක් සෙල්ලම් කරමින් ඉන්නවා.

ඉතින් මේ වෙලාවෙ එයාට හිතුණා මේ පුංචි මුව පැටියා කන්න තිබුණා නම් ඉතා රසවත් කෑමක් වෙයි කියලා. එහෙම හිතලා මේ කොටි රාළ හෙමින් හෙමින් මුව පැටියට ළං වුනා.



“ආ..........මේ තියෙන්නේ රස කෑමක්. කොටි රාළ කිව්වා. එක පාරටම කොටි රාළ කිවු දෙයින් මුව පැටියා තිගැස්සිලා ගියා.

එයාට එක පාරටම මතක් වුනා මේ කැලේ ඉන්න කපටි නපුරු  කොටි රාළ නේද කියලා. මුව පැටියත් එයාගෙ පුංචි නුවණ පාවිච්චි කරලා මෙහෙම කිව්වා.

අනේ බුද්ධිමත් කොටි රාළහාමි, ඔයාට පේනවනේ මම තවම පොඩි මුවෙක්. ඒ වගේම තවම මගේ ඇගේ මස් පිරිලා නෑ. හරියට බැලුවොත් කන්න දෙයකුත් නෑ.
මම අද කෑවා කියලා කොටි රාළගේ බඩ පිරෙන්නෙත් නැති වෙයි.

ඒ නිසා මම තව මාසයකින් අනිවාර්යෙන් හොදට කාලා බීලා ලොකු වෙලා මෙතෙන්ට එන්නම්. ඔයත් හරියටම එදා උදේ ඉර පායන වෙලාවට මෙතෙන්ට එන්නකො.
එතකොට කිසිම කරදරයක් නැතිව මාව කාලා දාන්න පුලුවන් බඩ පිරෙනකල්ම.



පුංචි මුව පැටියාගේ මේ අපුරු කතාවට මේ නපුරු කොටි රාළ රැවටුනා.

පුංචි වුනත් මුව පැටියා කියන දේ ඇත්තක් තියෙනවා. මොකද දැන් මුව පැටියා ගිල දැම්මොත් මගේ එක කටකට මදි වෙයි. තව ටිකක් ලොකු වුනාම කනවා....

එහෙම හිතලා කොටි රාළ යන්න ගියා.

දෙදෙනාම පොරොන්දු වූ දවසේ කතා කර ගත් පරිදි නියමිත ස්ථානයේ මුණ ගැසුනා.

මුව පැටියා පෙර දිනක කියූ ලෙසම තරමක් ලොකු වෙලා පුෂ්ටිමත් වෙලා ඉන්න බවක් කොටි රාළට පෙනුණා.

මට අද මෙයා බඩ පිරෙනකල් කන්න පුලුවනි

කොටියා කෑදර කමින් මුව පැටියා දෙස බලා සිටියා.

"ඔයා දැන් මගේ වැඩේට ලෑස්තිද?"

කොටියා මුව පැටියාගෙන් ඇසුවා.



"ඔව් ඔව් කොටි රාළහාමි. ඔයාට පේනවනේ මම එදා හිටියාට වඩා ගොඩක් මහත් වෙලා ලොකු වෙලා ඉන්නවා කියලා." මුව පැටියා කිව්වා.

හැබැයි මාව මරන්න කලින් මෙන්න මේ ලණුවෙන් මගේ කකුලක් ගැට ගසන්නකෝ. එතකොට ඔයාට මේ වැඩේ තවත් පහසු වේවි. මොකද මම එතකොට දුවන්න දගලන්නෙත් නැනේ.

ලණුවේ අනෙක් කොන ඔයාගෙ කකුලට දාගන්නකෝ. එතකොට බැරි වෙලාවත් මම දුවන්න ලෑස්ති වුනොත් ඔයාට තවත් ලේසිනේ මාව රදවා ගන්න.



ටික වේලාවක් කල්පනා කරමින් සිටි කොටි රාළ වැඩේට කැමති වුනා.

කොටි රාළ ලණුවේ අනෙක් කොන එයාගෙ කකුලට දා ගන්නවත් සමගම මුව පැටියා වේගයෙන් දුවන්න පටන් ගත්තා.

අනේ ඉතින් කැලෑවේ තිබුන ගල්, මුල් වලට සීරිලා, තුවාල වෙලා කොටි රාළගේ මුළු ඇඟම සීරුනා.



මේ සිද්ධිය දැකපු කැලෑවේ හිටපු අනෙක් යහළුවෝ හැමෝම එතෙන්ට එකතු වුනා.

මුව පැටියට කරදරයක් කරන්න හදපු බව කැලෑවේ යාළුවෝ හැමෝම තේරුම් ගත්තා.

කොටි රාළට ගොඩක් ලැජ්ජා හිතුනා.

ආයේ කවදාවත්  අහිංසක සත්තුන්ට කරදර කරන්න හොද නෑ, හැමෝමත් එක්ක සමගියෙන් ඉන්න ඕන කියලා කොටි රාළ හිතා ගත්තා.

......... නිමි............



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)